**දොම්පේ ප්‍රාදේශීය සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දොම්පේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දොම්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පලාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ පරිච්ඡේද 3.28 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී, දේපල පිරියත හා උපකරණ ක්ෂය වටිනාකම රු.1,206,257 ක් සහ පොලී ආදායම රු.6,413,232 ක් වැඩියෙන් අඩුකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතියේ ප්‍රකාරව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ පරිච්ඡේද 3.29 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ස්ථාවර තැන්පතුවලින් ලද මුදල් රු.15,000,000 ක් ගලපා නොතිබුණි. | එම | එම |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.51,439 ක්ද, දේපළ පිරියත උපකරණවල ශුද්ධ වටිනාකම රු.1,554,299 ක්ද වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවලට වූ සටහන් අංක 16 අනුව පාලම්, පාරවල්, බෝක්කු සහ පුස්තකාල පොත්වලට අදාල ක්ෂය වටිනාකම ලෙජර ගිණුම් හා සැසඳීමේදී, රු.399,481 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 760 | වත්කම් වර්ග 08 ක භාණ්ඩ 14 ක ඌනතාවයන්ද, රු.47,562ක් වූ පුස්තකාල පොත් 07 ක අස්ථානගතවීම්ද සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු කරගෙන යන බව | මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 08 | එක් එක් මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කරන ලද්දේ 2024 අප්‍රේල් 08 දින දීය. | සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2024 අප්‍රේල් 08 දින ඉදිරිපත් කර ඇති බව. | නියෝග අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.45,239,814 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.76,087,748 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 30,429,994 | 22,084,993 | 17,398,976 | 4,686,017 | 30,941,340 | 32,205,831 | 29,907,222 | 8,863,625 |
| (ii) | කුලී | 24,560,410 | 20,303,817 | 19,292,561 | 1,011,256 | 24,766,609 | 23,014,790 | 23,368,013 | 2,184,428 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,416,500 | 31,376,730 | 31,376,730 | | 1,093,000 | 1,046,094 | 1,046,094 | |
| (iv) | වෙනත් ආදායම් | 314,661,540 | 426,466,332 | 426,466,332 | | 14,720,698 | 148,813,229 | 148,813,229 | |
| | | 371,068,444 | 500,231,872 | 494,534,599 | 5,697,273 | 71,521,647 | 205,079,944 | 203,134,558 | 11,048,053 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 01 දිනට රු.8,863,625 ක්වූ හිඟ වරිපනම් හා බදු ශේෂයෙන් වර්ෂය තුල අය කිරීම් රු.4,797,294 ක් වූයෙන් හිඟයෙන් අය කිරීම් ප්‍රතිශතය සියයට 54 ක් වී තිබුණු අතර, වසර 5 ක සිට වසර 10 ක් අතර ශේෂය රු.982,961 ක්ද, වසර 3 ක සිට වසර 5 ක් අතර ශේෂය රු.1,903,390 ක්ද වී තිබුණි. | පිළිගන්නා බව | හිඟ වරිපනම් ශේෂ අය කළ යුතුය. |
| (ආ) | 2023 ජනවාරි 01 දිනට කුලී ආදායම් තුල ඇතුලත් රු.1,765,707 ක්වූ හිඟ ටෙන්ඩර් බදු ශේෂයෙන් වර්ෂය තුල අය කිරීම් රු.200,792 ක් වූයෙන් හිඟයෙන් අය කිරීම් ප්‍රතිශතය සියයට 11 ක් වී තිබුණු අතර, වසර 1 ත් 3 ත් අතර හිඟ කඩකුලී ශේෂය රු.115,125 ක් වී තිබුණි. | එම. | හිඟ ටෙන්ඩර් බදු ශේෂ අය කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපල හා පිරියත

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 68 ක් වැයකර ඉදිකර, පොළ කටයුතු සඳහා 2020 වර්ෂයේදී සභාව වෙත පවරා දී තිබුණු එක් මහලක් වර්ග අඩි 6,380 ක් පමණ වූ මහල් දෙකකින් යුතු ගොඩනැගිල්ලෙහි, කඩ කාමර 87 ක් පමණ වූ සම්පූර්ණ උඩුමහල සහ කඩ කාමර 73 ක් පමණ වූ බිම් මහලේ ඇතැම් කොටස් වෙළඳුන් විසින් භාවිතා නොකිරීමත්, පොළ දිනය හැර දින 6 ක්ම නිෂ්කාර්යව පැවතීමත් නිසා ගොඩනැගිල්ල ජනතාවට ඵලදායීව සහ සභාවට ආදායමක් ලැබෙන පරිදි යොදවා නොතිබුණි. | සති පොලකට පමණක් ඉදිකරණ ලද බැවින්, උඩු මහල මාකට් ක්‍රමයට ලබා දිමේ දි ගැටලු සහගත වන බව පෙන්වා දෙමි. | වත්කම් ඵලදායීව භාවිතා කළයුතුය. |
| (ආ) | 2018 වර්ෂයේදී සභා අරමුදලින් සහ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රු.8,629,760 ක් වැයකර එක් මහලක දිග අඩි 40.25 ක් පළල අඩි 19.75 ක් පමණ වන පහත මහලය කාමර 4 ක්ද, ඉහල මහලය රැස්වීම් ශාලාවක්ද වන පරිදි ඉදිකර තිබුණු ගොඩනැගිල්ලේ ප්‍රත්‍යාගණන වටිනාකම රු.10,000,000 ක් වී තිබුණද, ඉදිකළ දින සිට නිෂ්කාර්යව පැවතුණු බැවින් එම වැයකල වියදම නිෂ්කාර්ය වී තිබුණි. තවද ජලය හා විදුලියද ලබාගෙන නොතිබුණු අතර, ගොඩනැගිල්ලේ සවිකර තිබුණු ඇළුමිනියම් දොරවල් 3 ක් සහ දොර හැඩලයක්ද, කිසියම් පිරිසක් විසින් ගලවාගෙන ගොස් තිබුණි. | මේ වන විට විදුලිය සහ ජලය ලබා ගැනිමට ඉදිරි කටයුතු කර ඇති අතර, මහජනතාවගේ සුභ සාධක කටයුතු සඳහා භාවිතා කිරිම සඳහා සුභ සාධක සමිතියකට ලබා දී ඇති බව. | අරමුණුගත කාර්යය සඳහා භාවිතා කළ යුතුය. |
| (ඇ) | සභාව සතු තල කම්පනය සහ ජල බවුසරය 2023 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි. | තල කම්පනය අළුත්වැඩියාවට භාරදී ඇති අතර, ජල බවුසරයට යාන්ත්‍රික ඉන්ජිනේරු වාර්තාව ලබා ගැනීමට කටයුතු කරන බව. | අළුත්වැඩියා කර භාවිතා කිරීම හෝ විධිමත් පරිදි අපහරණය කළ යුතුය. |

3.2. **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශාලත්වය රූඩ් 02 පර්චස් 19.8 ක් සහ වටිනාකම රු.200,000 ක් වූ පොදු ඉඩමට කාණුවක් මගින් අනෙකුත් ඉඩම්වල ජලය හරවා තිබීමත්, ජලය බැස යාමට කාණුවක් නොතිබීමත් හේතුවෙන් ඉඩම කොහිල වලක් සහිත වගුරුබිමක් බවට පත්වී තිබුණි. | ඉඩම් හිමියන් පදිංචිවී නොමැති බැවින්, ඉදිරි පියවර ගෙන නොමැතිබව. | පොදු ඉඩම් කොටස නිසි පරිදි නඩත්තු කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.550,000 ක්වූ පොදු ඉඩමෙහි මූලා ප්‍රකාශනය හා පිඹුර අනුව ප්‍රමාණය රූඩ් 03 පර්චස් 36.4 වුවද, තැගි ඔප්පුව සහ භෞතික පරීක්ෂාව අනුව පර්චස් 29.52 ක් දක්වා අඩුවී තිබුණි. | ඔප්පුව හා භෞතික පරික්ෂාවක් කරනබව . | ඉඩම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය. |
| (ඇ) | සභාව සතු ඉඩම් 03 ක අනවසර ඉදිකිරීම් ඉවත් කර නොතිබුණි. | ඉවත් කිරිමට කටයුතු කරනබව. | අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතුය. |
| (ඈ) | වටිනාකම රු.46,240,764 ක් වූ විශාලත්වයේ එකතුව අක්කර 03 රූඩ් 02 පර්චස් 18.10 ක් වූ ඉඩම් 9 ක් නීත්‍යානුකූලව තහවුරු කරගෙන නොතිබුණි. | ප්‍රකාශන ඔප්පු සකස් කර ගන්නාබව. | අයිතිය තහවුරු කරගත යුතුය. |
| (ඉ) | ඉඩම් 03 ක් භෞතිකව තහවුරු කරගෙන තක්සේරුකර ලේඛනවලට ඇතුලත් කර ගෙන නොතිබුණි. | භෞතිකව තිබේදැයි සොයා ගත් පසු ලේඛණගත කරන බව. | සභාව සතු ඉඩම් තක්සේරුකර ලේඛනවලට ඇතුලත් කරගත යුතුය. |

**3.3. ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිවිසුම්ගත වටිනාකම රු.22,021,154 ක් වූ කර්මාන්ත 9 ක් 2024 මාර්තු 07 දින වන විට ගිවිසගත් කාලය අවසන් වී ඇතත්, නිම කර හෝ කාලය දීර්ඝ කරගැනීමක් සිදු කර නොතිබුණි. | ගෙවීම් වාර්තා ලද පසු දඩ මුදල් අයකර ගන්නා බව. | ගිවිසගත් කාලය තුල නිම කර ගැනීමත්, ප්‍රමාදවීම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීමත් කළ යුතුය. |